# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 සැප්තැම්බර්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 සැප්තැම්බර් මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 0.8%ක් බව එහි අධ්‍යක්‍ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 අගෝස්තු මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය 2.1%ක් ලෙස වාර්තා විය. 2023 සැප්තැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -2.4%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.2%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්‍ෂ්‍යමය උද්ධමනය 2023 අගෝස්තු මාසයේදී -5.4% සිට 2023 සැප්තැම්බර් මාසයේදී -5.2% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්‍ෂ්‍යමය උද්ධමනය 2023 අගෝස්තු මාසයේදී 9.0% සිට 2023 සැප්තැම්බර් මාසයේදී 5.9% දක්වා අඩුවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 අගෝස්තු මාසයේ 201.9ක් වූ දර්ශකාංකය 2023 සැප්තැම්බර් මාසයේ දී ද 203.5ක් ලෙස වැඩි වී ඇති බව වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2023 සැප්තැම්බර් මාසයේ දර්ශකාංකය 1.6 ක වැඩිවීමක්, එනම් 0.8ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. වියදම් අගය මත පදනම්ව, මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.41% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.36% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, දෙහි, ලොකුළූණු, අළුත් පළතුරු, සීනි, පොල්, මයිසූර් පරිප්පු, අමුමිරිස්, කවුපි, තේ කොළ/කුඩු, ගම්මිරිස් සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් එළවළු, කුකුළුමස්, අළුත් මාළු, රතුළූණු, පොල්තෙල්, කරවල, අර්තාපල්, බිත්තර, මුංඇට, මිරිස්කුඩු, සහල්පිටි සහ තිරිඟුපිටි යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 සැප්තැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'ප්‍රවාහන' (*පෙට්‍රල්, ඩීසල් සහ බස් ගාස්තු)*, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*එල්.පී.ගෑස්*), 'අධ්‍යාපන' (*ජාත්‍යන්තර පාසල් ගාස්තු*), 'ආපනශාලා සහ හෝටල්', 'රෙදිපිළි හා පාවහන්' (*රෙදිපිළි*) හා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*බුලත්*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත. තව දුරටත් සළකා බැලීමේදී 'විවිධ භාණ්ඩ හා සේවා' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. මේ අතර 'සෞඛ්‍ය', 'සන්නිවේදන' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල සැප්තැම්බර් මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්‍ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 අගෝස්තු මාසයේ 4.1% සිට 2023 සැප්තැම්බර් මාසයේදී 1.7% දක්වා අඩුවීමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි) , ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2022** | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| **2023** | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |